**අධ්‍යාපන අමාත්‍යාංශය**

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

## නියෝජ්‍ය අධ්‍යක්ෂ - නියෝජ්‍ය විදුහල්පති - (HM 1-3) - තනතුරු 01

අධ්‍යාපන අමාත්‍යාංශ, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති උක්ත සඳහන් තනතුර සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

**බාහිර**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මෝටර් කාර්මික/ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (විද්‍යාපති) ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක සාමාජිකත්වය ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමෙහි" අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය (Fellow Membership) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමෙහි" අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (HM 1-1) මට්ටමෙහි තනතුරු වන ප්‍රධාන ඉංජිනේරු (පුහුණු), ප්‍රධාන ඉංජිනේරු (නිෂ්පාදන, සේවා හා නඩත්තු) හෝ ශාඛා විදුහල්පති තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -** HM 1-3 - 2016 - රු. 86,865 - 2,270x15 - 120,915/-

(මීට අමතරව රජය මඟින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය -** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ -**

- රාජ්‍ය චක්‍රලේඛ අනුව නිල ප්‍රවාහන පහසුකම්
- රාජ්‍ය චක්‍රලේඛවලට අනුකූලව වාර්ෂික ප්‍රසාද දීමනා හිමිකම.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 8% ක් අයකර ගනු ලබන අතර, ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3%ක් වේ.

**පොදු කොන්දේසි -**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු / ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩබලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරට බඳවා ගැනීම් අදාළ තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික

(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

(ඇ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුළත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමඟ **2022-07-08 දිනට ප්‍රථම ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය, අංක 354/2, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය,**
**අංක 354/2, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, කොළඹ 05.**